# කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව
## කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 12 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ උත්පාදිත ආදායමක් නොවන රු.7,193,372 ක මුද්දර ගාස්තු ආදායම උත්පාදිත ආදායම් ප්‍රභවයක් වන සේවා සඳහා ගාස්තු යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) රු.27,046,083 ක් වූ යන්ත්‍ර 05 ක වටිනාකම මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) කුලී ආදායම් යටතේ ගිණුම්ගත කළයුතු රු.2,119,895 ක සතිපොළ ආදායම් වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව පුස්තකාල පොත් වටිනාකම රු.2,593,329 ක් වුවද, ගිණුම අනුව පොත් වටිනාකම රු.2,509,863 ක් වූයෙන් ස්ථාවර වත්කම් රු.83,466 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.3,869,100 ක වැටුප් ප්‍රතිපූර්ණ රු.2,566,019 ක් ලෙස දැක්වීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් රු.1,303,081 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පළාත් පාලන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායකය වෙනුවෙන් සේවක වැටුපෙන් අඩුකළ මුදල් වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමට බැර කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාලව අඩුකළ රු.106,383 ක මුදල වැටුප් හා දීමනා ගිණුම බැර කිරීම මත අදාල වියදම හා වැටුප් ප්‍රතිපූර්ණ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04 ක පැවති ශේෂයන් හා ඒවාට අදාල අනුරූපී ලේඛනවල පැවති ශේෂයන් අතර රු.1,173,869 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

(i) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 15,663,253 ක් වූ අතර ඉන් රු.6,250,382 කට අදාලව කාල විශ්ලේෂණයන් විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර රු.174,566 ක් වසර 03 කට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂයන් විය.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 15,663,253 න් සියයට 31 ක් හෙවත් රු.4,975,450 ක් ලැබිය යුතු මුද්දර ගාස්තු වූ අතර සියයට 20 ක් හෙවත් රු.3,202,285 ක් කර්මාන්ත ණයගැතියන් විය.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

(i) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 14,048,130 ක් වූ අතර ඉන් රු.2,323,639 ක ශේෂවලට අදාලව කාල විශ්ලේෂණයන් විගණනයට ඉදිරිපත් නොකළ අතර රු.1,883,697 ක ශේෂයන් වසර 03 ක් ඉක්මවූ කාලයක් නිරවුල් නොකළ ශේෂයන් විය.

(ii) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 14,048,130 න් සියයට 68 ක් හෙවත් රු.9,538,529 ක් කර්මාන්ත ණය හිමියන් වූ අතර රු.475,257 ක් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ශේෂයන් විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.17,180,252 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාලව ශේෂ සැසඳුම්ලත් ආකාරය දැක්වෙන ලේඛනයක්/ උපලේඛනයන් විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

### 1.3.6 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

සමාලෝචිත වර්ෂයේදී සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය හා ක්‍රිකට් උපාංග බෙදාදීම වෙනුවෙන් රු.70,185 ක් සහ ලෝක ළමා දින වැඩ සටහන සම්බන්ධයෙන් සම්පත් දායක දීමනා ලෙස රු.10,000 ක මුදලක් වියදම් කර තිබුණද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,177,503 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.925,430 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,252,073 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.109,556,264 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.114,268,450 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.3,465,317 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | ආදායම 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | වියදම 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 10,568 | 4,978 | 5,590 | පෞද්ගලික පඩිනඩි | 26,887 | 20,211 | 6,676 |
| (ii) | වෙනත් | 36,798 | | 6,463 | අනෙකුත් | 12,302 | | (1,874) |
| | උප එකතුව | 47,366 | 30,335<br>35,313 | 12,053 | උප එකතුව | 39,189 | 14,176<br>34,387 | 4,802 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 109,556 | 25,140 | 84,416 | ප්‍රාග්ධන වියදම | 114,268 | 25,386 | 88,882 |
| | මුළු එකතුව | 156,922 | 60,453 | 96,469 | මුළු එකතුව | 153,457 | 59,773 | 93,684 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 8,177 | 925 | 7,252 | අතිරික්තය/ ඌනතාවය | 3,465 | 679 | 2,786 |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.47,366,529 න් සියයට 77 ක් හෙවත් රු.36,798,969 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.109,556,264 න් සියයට 95 ක් හෙවත් රු.104,423,760 ක් පරිත්‍යාග වශයෙන් ලද වාහන වටිනාකම හා දැයට කිරුළ ප්‍රතිපාදන වලින් සමන්විත විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.39,189,026 න් සියයට 68 ක් හෙවත් රු.26,887,257 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 90 ක් හෙවත් රු.24,384,970 ක් පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබූ වැටුප් ප්‍රතිපූර්ණ විය. එම වටිනාකම වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.114,268,450 න් සියයට 91 ක් හෙවත් රු.104,423,760 ක් පරිත්‍යාග වශයෙන් ලද වාහන වටිනාකම හා දැයට කිරුළ ප්‍රතිපාදන මත සිදුකළ සංවර්ධන කාර්යන්ගෙන් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

ඇස්තමේන්තුගත ආදායම හා තත්‍ය ආදායම සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තු ගත | 2015 තථ්‍ය | 2015 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තු ගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 1,259 | 1,055 | 377 | 1,504 | 1,062 | 355 |
| (ii) | බදුකුලී | 1,184 | 1,203 | 23 | 1,584 | 787 | 251 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 644 | 487 | - | 640 | 624 | 209 |
| (iv) | වෙනත් ආදායම් | 32,854 | 44,622 | 11,417 | 25,873 | 32,840 | 9,080 |
| | එකතුව | 35,941 | 47,367 | 11,817 | 29,601 | 35,313 | 9,895 |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | ආදායම් රැස් කිරීම 2015/01/01 දක්වා හිඟයෙන් | ආදායම් රැස් කිරීම බිල්කළ ආදායමින් | ආදායම් රැස් කිරීම එකතුව | හිඟහිටි ශේෂය 2015/01/01 දිනට පැවති හිඟයෙන් | හිඟහිටි ශේෂය බිල්කළ ආදායමින් | හිඟහිටි ශේෂය 2015/12/31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු | 355 | 1,055 | 1,410 | 103 | 930 | 1,033 | 252 | 125 | 377 |
| බදු කුලී | 251 | 1,203 | 1,454 | 235* | 1,196 | 1,431 | 16 | 07 | 23 |
| බලපත්‍ර ගාස්තු | 209 | 487 | 696 | 209* | 487 | 696 | - | - | - |
| වෙනත් ආදායම් | 9,080 | 44,622 | 53,702 | 9,080 | 33,205 | 42,285 | - | 11,417 | 11,417 |
| එකතුව | 9,895 | 47,367 | 57,262 | 9,627 | 35,818 | 45,445 | 268 | 11,549 | 11,817 |

* 2015 ජනවාරි 01 දිනට පැවති කුලී හිඟයෙන් රු.209,623 ක් හා බලපත්‍ර ගාස්තු රු.209,095 ක් ජර්නල් සටහන් මඟින් සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි.

### 2.3.3 බදු කුලී

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී දැයට කිරුළ මගින් කොබෙයිගනේ බස් නැවතුම්පලහි ඉදිකර තිබුණු අඩි 8x8 පමණ ප්‍රමාණයේ කඩ කාමර දෙක ටෙන්ඩර් මගින් වසර තුනකට ලබාදීමට සභාව තීරණය කර තිබුණද, එක් කඩ කාමරයක් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව 2015 ජනවාරි සිට බාහිර පාර්ශවයකට රු.2,500 ක මාසික කුලියට ලබා දී තිබුණි.

(ආ) කඩ කුලී ගෙවීම් සම්බන්ධයෙන් එක් එක් කඩ සඳහා එළඹගත් ගිවිසුම් අනුව ප්‍රමාද වන කඩකුලී වෙනුවෙන් සියයට 10 ක දඩ මුදලක් ගෙවිය යුතු බව සඳහන් කලද කඩකුලී ලේඛණය අනුව ප්‍රමාද වීම් සඳහා දඩ මුදල් අයකර නොතිබුණි.

### 2.3.4 බලපත්‍ර ගාස්තු

ස්ථාපිත කර තිබූ කුළුණු 08 ට අදාලව ශ්‍රී ලංකා ජන රජයේ 2015 අප්‍රේල් 17 දින අංක 1597/8-2009 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් හා වැඩි වන සෑම මීටර් එකකටම රු.100 බැගින් ගාස්තු අයකළ යුතු වුවත්, එක් ආයතනයකින් පමණක් ගාස්තු අයකර තිබුණි. එමෙන්ම කුළුණු සඳහා වාර්ෂික අයකල යුතු ව්‍යාපාර බදු අයකර නොතිබුණු අතර වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර තිබුනේ එක් ආයතනයකින් පමණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.873,766 ක් වූ අතර ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රු.4,975,450 ක් පමණ විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

මියගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් හිඟව පවතින රු.167,245 ක සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මිනුම්ගත නොහැකි අයුරින් 3/4 කලුගල්, චිප්ස්, ගංගා වැලි, බොරළු ප්‍රමාණයක් සහා ක්‍රීඩාපිටිය අසල ගොඩගසා තිබුණු අතර එම අමුද්‍රව්‍ය සටහන් කිරීම සඳහා ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3.3 අවිධිමත් ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වයඹ පළාත් සභාවේ 2012 මැයි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 5/අමා/2012/48 ප්‍රකාරව ප්‍රාදේශීය සභා සභාපතිගේ පෞද්ගලික ලේකම් තනතුර සඳහා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකුට මසකට රු.8,000 ක දීමනාවක් හෝ එසේ නොවන්නෙකුට රු.6,000 ක දීමනාවක් ගෙවිය හැකි වුවද, සභාව විසින් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු නොවන අයෙකුට 2013 සැප්තැම්බර් සිට 2015 අප්‍රේල් දක්වා කාලයට අදාලව මසකට රු.8,000 බැගින් ගෙවීම නිසා රු.40,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) ඉහත අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි සභාපතිගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා මසකට රු.4,000 ක උපරිමයකට යටත්ව ගෙවිය හැකි වුවද, 2014 ජනවාරි සිට 2015 අප්‍රේල් දක්වා කාලයට අදාලව මසකට රු.5,000 බැගින් ගෙවීම මත රු.16,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ ග්‍රාම නිලධාරී වසම් 33 ක එක් ගමකට එක් වැඩක් වැඩ සටහන මගින් මාර්ග මෝටර් ග්‍රේඩර් කර තැලවිල්ල හෝ බෝක්කු දමා සංවර්ධනය කර තිබූ මාර්ග සංඛ්‍යාව 372 ක් වූ අතර ඒ ඇතුලත මාර්ග 25 ක බෝක්කුවක් හෝ තැලවිල්ලක්ද ඉදි කර තිබුණි. ඒ අනුව මුළු නිමි වැඩ වටිනාකම වූ රු.14,452,818 න් රු.1,959,486 ක් එනම් මුළු මුදලින් සියයට 13 ක් පමණක් දිගු කාලීන ඵලදායී ඉදි කිරීම් වූ තැලවිලි හෝ බෝක්කු ඉදි කිරීම සඳහා යොදා තිබුණු අතර රු.9,199,041 ක මුදලක් මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම සඳහාද, බොරළු දැමීම සඳහා රු.3,294,291 ක්ද වශයෙන් එනම් මුළු මුදලින් සියයට 87 වියදම් කර තිබුණි.

(ආ) මෝටර් ග්‍රේඩර් කරන ලද මාර්ග 2015 දෙසැම්බර් 15 දින භෞතිකව පරීක්ෂා කිරීමේදී පෙර තිබූ තත්ත්වයටම පත්වී තිබූ අතර මෝටර් ග්‍රේඩර් කිරීම හේතුවෙන් පැවති මාර්ගය පටු වී තිබුණු බැවින් ද ඒ සඳහා වියදම් කරන ලද රු.9,199,041 මුදල් අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි.

(ඇ) සෘජු ශ්‍රමය පදනම මත ඉදි කිරීමට සැලසුම් කර තිබුණු සභාවේ ගරාජයේ ඉදි කිරීම් සඳහා සභා කාර්යය මණ්ඩලයේ සහභාගිත්වයද ලිඛිතව තහවුරු වූ අතර අවස්ථා 03 කදී පුහුණු හා නුපුහුණු කම්කරුවන් සඳහා රු.109,900 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. ගෙවීම් ලබන්නාගේ අත්සන් සැසඳීමේදී එකම නම ඉදිරියෙන් වූ සමහර අත්සන් වෙනස් බව නිරීක්ෂණය වූ අතර ගෙවීම්වල අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා පදිංචි ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හෝ සටහන් කර නොතිබුණි. සෘජු ශ්‍රම පදනමට ඉදි කිරීමට කටයුතු කර තිබුණු මෙම ඉදි කිරීම සඳහා බාහිර පාර්ශවයකට ගෙවීම් සිදුකර ඉදි කිරීමට සභා අනුමැතිය හෝ කමිටු තීරණයක් නොතිබුණු අතර අදාල ඇස්තමේන්තු සංශෝධනය කරද නොතිබුණි.

(ඈ) මාඋල්ල ග්‍රාම නිලධාරී වසමේ කළුආරච්චියාගම මාර්ගය සංවර්ධන කටයුතු සඳහා රු.650,000 ක ඇස්තමේන්තු අනුමත වී තිබුණු අතර ඉන් රු.269,864 ක් නිමි වැඩ වටිනාකමක මාර්ගය බොරළු දමා සංවර්ධනය කළද, තැලවිල්ල ඉදිකර නොතිබූ බව 2015 දෙසැම්බර් 15 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 04. <u>යහපාලනය හා ගිණුම්කටයුතු භාවය</u>

### 4.1 <u>අයවැය පාලනය</u>

සභාවේ උත්පාදිත ආදායම් යටතේ අය විෂයයන් 02 ක් යටතේ ඇස්තමේන්තුගත ආදායම රු.1,903,000 ක් වූ අතර අය කරගෙන ඇති ආදායම රු.1,542,000 ක් විය.

### 4.2 <u>අභ්‍යන්තර විගණනය හා කළමනාකරණ කමිටු</u>

සමාලෝචිත වර්ෂයට අදාලව විගණන හා කළමනාකරණ කමිටුව අවස්ථා 04 කදී රැස්වී තිබූ අතර ඒ යටතේ වූ අභ්‍යන්තර විගණන ඒකකයෙන් ප්‍රමාණවත් විගණනයක් සිදුව නොතිබුණි.

### 4.3 <u>නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

වටිනාකම රු.650,000 ක් වූ කැබ් රථයක් හා වටිනාකම රු.1,093,400 ක් වූ බැකෝ යන්ත්‍රයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රයෝජනයටගත නොහැකි තත්ත්වයෙන් පැවතුණි.

## 05 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පැලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය